# වින්දනයක්ම වූ ළමා විය

පී.එච්.එන්. ඉලංගරත්න

වී.ඩී. ද ලැනරෝල් මහතා විසින් ලියවුණු පිරිසිරිගේ පාසල් සමය නම් මෙම ග්‍රන්ථය කොළඹ සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම විසින් මුද්‍රණය කර ප්‍රසිද්ධ කර ඇත.
වී.ඩී. ද ලැනරෝල් මහතා විසින් රචිත වූ මෙම ග්‍රන්ථය ඔහුගේ ළමා කාලය හා සම්බන්ධ දිගහැරුමකි. මෙහි ඔහුගේ පාසල් සමයෙහි කියවන්නට ලැබෙන්නේ පිටිසර විත්ති හා පිටිසරයන් පිළිබඳ තොරතුරුය. ඔහු මෙහිදී හුවා දක්වීමට උත්සාහ කර ඇත්තේ ඔහුගේ ළමා වියෙහි පිටිසරත්, වත්මන් පිටිසරත් අහසට පොළව මෙන් වෙනස් බව ය.
දං ගස්වලට බඩ ගා, අතුවලට නැගී වඳුරන් මෙන් කැකෝ ගසමින් දං කැමෙන් දතුත්, තොලුත් දං පාට වූ ළමයි ක්‍රීඩා පිණිස මුහුණු සායම් කර ගත් නළුවන් මෙන් දිස් වෙයි. පියසිරිගේ පාසල් සමයේ ක්‍රිකට් ක්‍රීඩාව ඇතැම් විට පවත්වන නමුත්, ඒ සඳහා නියම ක්‍රිකට් බෝල හෝ ක්‍රිකට් බැට් ආදිය නැත. විකට් වශයෙන් කැලෑවෙන් කපා ගන්නා ලද පේර කෝටු හයක් හා බෝලය වශයෙන් උණු අළු පල්ලේ දමා පදම් කර ගන්නා ලද ජම්බෝල ගැටයක් හෝ මූදු කඳුරු ගෙඩියක් හෝ ......... බැට් පිත්ත වශයෙන් පාවිච්චි කරන ලද්දේ පොල් පිත්තක් හෝ ලෑල්ලකි. මහසොහොන් ක්‍රීඩාව මෙන් ළමයින් නිතර ම යෙදෙන තවත් ක්‍රීඩාවක් නම් චක්ගුඩු සෙල්ලමයි. එහි දිනන්නට හැකි වන්නේ වැඩි වේලාවක් හුස්ම අල්ලන්න පුළුවන් වූ ද, ශක්ති සම්පන්න වූ ද ළමයිට ය. තවත් ළමයි මාබල් හෙවත් ටික් බෝල් ක්‍රීඩාවේ යෙදී සිටියේ ය.
ඉංග්‍රීසි පිළිවෙළට ආරම්භ කරන ලද එක්තරා සෙල්ලමක් නම් හාවුන් සහ බල්ලන්ගේ ක්‍රීඩාවයි. ඊට ''පේපර් චේස්'' ක්‍රීඩාවයි ද........ ළමයි දෙපිළකට බෙදී කොටසක් හාවුන් මෙන් පිටත් වේ. අනික් කොටස බල්ලන් මෙන් ඔවුන් លුහුබැඳ යෙයි. හාවුන් මෙන් දුවන ළමයි බල්ලන් මෙන් දුවන ළමයිට ඉව වැටීම සඳහා කුඩා කඩදාසි විසුරවා යන මග දමා දුවති. ...... බල්ලන්ගේ ගමන ප්‍රමාද කිරීමටත් නියම පාර හැර තවත් නොයෙක් අතට ගමන් කොට කඩදාසි කැබලි විසුරුවමින් යන්නාහ.
ලොකු ඉස්සන් දැලෙන් ගලවා කූඩයට දැමීම ........ ලොකු ප්‍රීතියකි. ......... ආපසු එක ගමක් දේවාලේ කන්ද ළඟ ගස ළඟින් ගඟට බසින්නෝය. දඩයම් කරන කාලයේ අකර තැබ්බියකින් තුවක්කුව ගැස්සී වෙඩිල්ල නළල බිඳ ගෙන ගොස් සෙනසුරාදා ඉරිදා දිනවල මේ තුවක්කුව රැගෙන කොබෙයියන්, වටුවන්, දියකාවුන් ආදී කුරුල්ලන් වෙඩි තැබීම සඳහා බෝ විලට හෝ මහ වෙලට යන්නේය. අඹ, මූණමල් ආදී පළතුරු ගස් යට රැක සිට කොට්ටෝරුවන්, ගිරවුන්, කැරලුන් ආදී ශෝභන සියොතුන් ද වෙඩි තැබීම පොඩියන්ට සතුටට හේතුවකි. නිතර වෙඩි තැබීමේ යෙදීමෙන් පොඩියන් සිඤ්ඤෝ දක්ෂ වෙඩික්කාරයෙක් විය. ඔහුට කුරුමානම වරදින්නේ කලාතුරකිනි. වෙඩි තැබීමෙහි හෙතෙම කෙතරම් දක්ෂ වී ද යත් ඇළේ දිය පිට මතු වන ලූලන් පවා වෙඩි තැබීමට ඔහුට පුළුවන් විය. කැළණි ගඟ බැස ගිය විට රාත්‍රියේ හුළු මස් කෙටීම ළමයිට ක්‍රීඩාවකි. එක එක ළමයා හුළු එළියක් හා කඩුවක් රැගෙන නොගැඹුරු දියට බැස ගිනි කත වැටීමෙන් නිශ්චල ව සිටින මසුන් කොටන්ටන් ය. වැලි තලාවක ඉඳ ඇමට ඉස්සන් යෙදූ බිලී පිත්තකින් වැලි ගොව්වන් බෑම ද ...... ක්‍රීඩාවකි.කුරුම්බා කා ඉවර වූ පසුත් නාන්නට බසින්නේ බැල්ලෙහි තවත් ක්‍රීඩා කිරීමෙන් පසුය. නාන්නට යන විට ගෙන යන්නේ අමුඩ ලේන්සු, තුවාය, සබන් ආදී නෑමට උවමනා උපකරණ පමණක් නොවේ. සර්කස් ක්‍රීඩා කරුවන්ගේ වළලු ක්‍රීඩාවේ ....... වේවැල් වළලු කීපයක් ද ළමයෙකු අත වෙයි. වළල්ල මැදින් රිංගා දියට පනින්නේ ය. එය පුරුදු වීමෙන් පසු වළලු දෙකකින් තුනකින් ....... වැඩි ගණනකින් රිංගීමට පුරුදු ....... හිටි පිනුම්, බඩ පිනුම් ....... පුරුදු වීමට මේ වැලි තලාවට වඩා සුදුසු අන් කිසි තැනක් අසලක නැත්තේ ය. පිනුම් පැනීමෙන් පසු ළමයින් පටන් ගන්නේ දිය ඉස ගැනීමට ය. බඹයක් පමණ දුරින් මුහුණට මුහුණලා සිට ගෙන එක් අයෙකුගේ මුහුණට අනික් අය තදින් වතුර ඉසීම සියලු ම ළමයින්ට පුරුදු ජල ක්‍රීඩාවකි. ....... පුරුදු අයෙකුගේ අතින් ඉසිනු ලබන වතුර පහරක් ඉවසා ගැනීම බොහෝ අමාරු ය. පහරට පහර වතුර ගසා ...... කාය ශක්තිය වැඩි තැනැත්තා නිතරම දිනන්නේ ය. ගඟේ ගැඹුරු ස්ථානයට ගොස් මෝරුන් ඇල්ලීමේ ක්‍රීඩාව ආරම්භ කරන්නෝ ය. ...... පාරුව තල්ලු කිරීමට ලැබීම ඊටත් වඩා සන්තෝෂ ජනකය.

වී.ඩී. ද ලැනරෝල්, පිරිසිරිගේ පාසල් සමය, සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.